කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2011/2012
2014 අප්‍රේල්/ මැයි/ ජූනි

මානවශාස්ත්‍ර පීඨය

පාලි - PALI E3025

පාලි පිටකාගත දර්ශනය, ආචාරධර්ම හා මූලාශ්‍රය අධ්‍යයනය

කොටස් තුනෙන්ම ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි | කාලය : පැය 03 යි

---

## 1 කොටස

01. සසර නැවැත්ම පිණිස ත්‍රිලක්ෂණාවබෝධය හේතු වන්නේ කෙසේදැයි ධර්මානුකූල ව පැහැදිලි කරන්න.

02. පටිච්චසමුප්පාද සිද්ධාන්තය පිළිබඳ හැඳින්වීමක් කොට, එහි මූලික හා අතිරේක අරමුණු කවරේදැයි සූත්‍රානුසාරයෙන් පැහැදිලි කරන්න.

03. නාමරූප විභාගය තුළින් පුද්ගලයා හා ඔහුට සාපේක්ෂක ලෝකය බුදුසමය තුළ විවරණය කොට ඇත්තේ කෙසේදැයි පෙළ දහම ඇසුරෙන් විශද කරන්න.

04. ත්‍රිපිටකාගත සූත්‍ර දේශනාවන්ට අවධානය යොමු කරමින් කුසලාකුසල නිර්ණායක පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වල ඇති සර්වදේශීය වලංගුතාව සෝදාහරණ ව සාකච්ඡා කරන්න.

## 11 කොටස

05. සංඝ සංස්ථාවෙහි යහපැවැත්ම උදෙසා බුදුන් වහන්සේ විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පාරාජිකපාළිය ඇසුරින් විමසීමට ලක්කරන්න.

06. බුදුසමය තුළ චරිත විශ්ලේෂණයේ දී පුද්ගල ක්‍රියාකාරකම් පාදක කොටගෙන ඇති ආකාරය පෙළ දහම ඇසුරින් විමසන්න.

07. ශාසනික වත්පිළිවෙත් සංඝ සමාජයේ ප්‍රගමනයට හේතු වන අයුරු චුල්ලවග්ගපාළියේ වත්තක්ඛන්ධකය ඇසුරින් පරීක්ෂාවට ලක්කරන්න.

## 111 කොටස

08. (අ) සිංහලානුවාදයක් සපයන්න.

තත්ථ ඔවදෙය්‍යාති උප්පන්නෙ වත්ථුස්මිං වදන්තො ඔවදති නාම, අනුප්පන්නෙ වත්ථුස්මිං ''අයසොපි තෙ සියා''ති ආදිවසෙන අනාගතං දස්සෙන්තො අනුසාසති නාම. සම්මුඛා වදන්තො ඔවදති නාම, පරම්මුඛා දූතං වා සාසනං වා පෙසෙන්තො අනුසාසති නාම. සකිං වදන්තො ඔවදති නාම, පුනප්පුනං වදන්තො අනුසාසති නාම. ඔවදන්තො එව වා අනුසාසති නාමාති එවං ඔවදෙය්‍ය අනුසාසෙය්‍ය. අසබ්භා චාති අකුසලධම්මා ච නිවාරෙය්‍ය, කුසලධම්මෙ පතිට්ඨාපෙය්‍යාති අත්ථො. සතඤ්හි සො පියො හොතීති සො එවරූපො පුග්ගලො බුද්ධාදීනං සප්පුරිසානං පියො හොති. යෙ පන අදිට්ඨධම්මා අවිතිණ්ණපරලොකා ආමිසචක්ඛුකා ජීවිකත්ථාය පබ්බජිතා, තෙසං අසතං සො ඔවාදකො අනුසාසකො, '''න ත්වං අම්හාකං උපජ්ඣායො, න ආචරියො, කස්මා අම්හෙ ඔවදසී'ති එවං මුඛසත්තීහි විජ්ඣන්තානං අප්පියො හොතී''ති.

(ආ) ''අකුසලධම්මා ච නිවාරෙය්‍ය, කුසලධම්මෙ පතිට්ඨාපෙය්‍ය'' යන්නට ධර්මානුකූල විවරණයක් සපයන්න

09. (අ) සිංහලානුවාදයක් සපයන්න.

WHAT IS VIRTUE? It is the states beginning with volition present in one who abstains from killing living things, etc., or in one who fulfils the practice of the duties. For this is said in the Paṭisambhidā: 'What is virtue? There is virtue as volition, virtue as consciousness-concomitant, virtue as restraint, virtue as non-transgression'

Herein, *virtue as volition* is the volition present in one who abstains from killing living things, etc., or in one who fulfils the practice of the duties. *Virtue as consciousness-concomitant* is the abstinence in one who abstains from killing living things, and so on. Furthermore, *virtue as volition* is the seven volitions [that accompany the first seven] of the [ten] courses of action (kamma) in one who abandons the killing of living things, and so on. *Virtue as consciousness-concomitant* is the [three remaining] states consisting of non-covetousness, non-ill-will, and right view, stated in the way beginning 'Abandoning covetousness, he dwells with mind free from covetousness'

(ආ) විසුද්ධිමග්ගයේ සීලනිද්දෙසයේ අන්තර්ගතය පිළිබඳ සමාලෝචනයක් කරන්න.

10. පහත සඳහන් ඡේද නාගර හෝ රෝමන් අකුරෙන් පිටපත් කරන්න.

තමඤ්ඤො එවමාග: 'අත්ථි ඛො භො එසො අත්තා යං ත්වං වදෙසි. න සො නත්ථීති වදාමි. නො ච ඛො භො අයං අත්තා එත්තාවතා සම්මා සමුච්ඡින්නො හොති. අත්ථි ඛො භො අඤ්ඤො අත්තා සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනූපගො තං ත්වං න ජානාසි න පස්සසි. තමහං ජානාමි පස්සාමි. සො ඛො භො අත්තා යතො කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න ගොති පරම්මරණා. එත්තාවතා ඛො භො අයං අත්තා සම්මා සමුච්ඡින්නො හොතී'ති. ඉත්ථෙකෙ සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති.

තමඤ්ඤො එවමාහ: 'අත්ථි ඛො භො එසො අත්තා යං ත්වං වදෙසි. නෙසො නත්ථීති වදාමි. නො ච ඛො භො අයං අත්තා එත්තාවතා සම්මා සමුච්ඡින්නො හොති. අත්ථි ඛො භො අඤ්ඤො අත්තා සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම සන්තමෙතං පණීතමෙතන්ති නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගො. තං ත්වං න ජානාසි න පස්සසි. තමහං ජානාමි පස්සාමි. සො ඛො භො අත්තා යතො කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා. එත්තාවතා ඛො භො අයං අත්තා සම්මා සමුච්ඡින්නො හොතී'ති. ඉත්ථෙකෙ සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති.